වගා සහනාධාර චක්‍රලේඛ අංක - 84

අපේ අංකය:-සං/01

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

අංක 70, පාර්ලිමේන්තු පාර,

පැලවත්ත, බත්තරමුල්ල.

2021.04. 23

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්,

**<u>පොල් වගාකරඇති ඉඩම්වල පොල් සමග තේ මිශ්‍ර වගාව.</u>**

මෙම චක්‍රලේඛයේ අරමුණ:

I. පොල් වගා ඉඩම්වල පොල් සමග තේ වගාව තුලින් භූමි ඵලදායීතාවය හා වගාකරුවන්ගේ අදායම වැඩි කිරීම සහ එක් එක් බෝගයේ වෙළදපොළ මිල වෙනස්වීම්වලදී කුඩා ඉඩම් හිමියාගේ ආදායමට ඇතිවන අහිතකර බලපෑම අවම කිරීම.

ii පරිසර හිතකාමී තත්වයක් වැවිලි ප්‍රදේශය තුල ඇති කිරීම හා පූර්ණ කාලීන රැකියා අවස්ථා වැඩි කිරීම.

පොල් සමග තේ මිශ්‍ර වගාව සඳහා සහනාධාර ක්‍රමයක් 2001 වර්ෂයේදී පොල් වගා කිරිමේ මණ්ඩලය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද නමුත් මේවන විට එම ආධාර ක්‍රමය අක්‍රිය වී ඇත. එසේ වුවත් පවතින පොල් ඉඩම්වල තේ වගාව සඳහා ගොවීන්ගේ නැඹුරුවක් පවතින බැවින් තේ වගාවට යෝග්‍ය ප්‍රදේශ තුල පවතින පොල් වගා ඉඩම්වල තේ පර්යේෂණායතනය විසින් 2000.04.26 දිනැතිව නිකුත්කර ඇති පොල් සමග තේ අතුරු වගාව සඳහා වන මාර්ගෝපදේශයේ, පොල් වගාව පවතින ඉඩම්වල තේ වගාව සම්බන්ධයෙන් වන මගපෙන්වීම් හා වගා පරතරයන්ට අනුකූලව දැනට පොල්වගා කරඇති ඉඩම්වල තේ අළුත් වගා සහනාධාර ක්‍රමය යටතේ නියමිත සහනාධාර මුදලින් 75% ක මුදලක් හිමිවන ලෙසට මෙම සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

1. පවතින පොල් වගා ඉඩම්වල තේ වගාවට සුදුසු ඉඩම්

   i තේ වගාවට යෝග්‍ය ප්‍රදේශයක පවතින පොල් ඉඩමක් විය යුතුය.

   ii වයස අවුරුදු 35 ඉක්මවූ හා තේ වගාව සඳහා ප්‍රමාණවත් හිරුඑළිය ලැබෙන ඉඩමක් විය යුතුය.

   iii පොල් ඉඩමේ පොල් වගා පරතරය මීටර් 8×8 ( අඩි 26 × 26 )පරතරය හෝ ඊට වැඩි විය යුතුය.

ඉඩමේ පාංශු තත්ත්වය ප්‍රමාණවත් සාරවත් භාවයක් නොමැති ආන්තික තත්ත්වයක් පවතීනම් නිර්දේශිත තෘණ යොදා පාංශු පුනරුත්තාපනය කළ යුතුවේ.

2. තේ පැල සිටුවීමේ පරතරය

පවතින පොල් වගාව තුල තේ වගාවේදී පහත ක්‍රම දෙක යටතේ තේ වගා කල හැක.

i පොල් පේලි අතර තේ වගා කිරීම.

මෙහිදි පොල් ගසේ සිට අවම වශයෙන් මීටර් 2.4 (අඩි 8) ක් දුරින් පොල් පේලි අතර තේ වගාව කල යුතුය.

ii පොල් ගසට මීටර් 2.4 (අඩි 8) ක කවය හැර ඉතිරි ක්ෂේත්‍රයේ තේ සිටුවීම.

මෙහිදී පොල් ගසේ සිට මීටර් 2.4 (අඩි 8) ක අරයකින් යුතු කවය හැර ක්ෂේත්‍රය පුරා තේ වගා කල හැක.

ඉහත ආකාර දෙක යටතේ තේ ප්‍රභේදවල වර්ධනය අනුව තේ සිටුවීමේ පරතරය පේලි අතර පරතරය අඩි 3 1/2 සිට 4 දක්වා පරතරය හා තේ පේලිය තුල අඩි 2 ක පරතරයට තේ වගාව සිදුකල හැකි අතර ඒ අනුව තිබිය හැකි තේ පැල සංඛ්‍යාව පහත පරිදි වේ.

| වගා ක්‍රමය | තේ වගා පරතරය | හෙක්ටයාරයකට (අක්කරයකට) තේ පැල සංඛ්‍යාව |
|---|---|---|
| 1. පොල් පේලි අතර පොල් ගසට මීටර් 2.4 (අඩි 8) දුරින් පොල් පේලි අතර තේ වගා කිරීම. | මීටර 1.0 X 0.6 (අඩි 3 1/2 X 2) | 10000 (4000) |
| | මීටර් 1.2 X 0.6 (අඩි 4 X 2) | 8100 (3240) |
| 2.පොල් ගසට මීටර් 2.4 (අඩි 8) කවය හැර ඉතිරි ක්ෂේත්‍රයේ තේ වගා කිරීම. | මීටර 1.0 X 0.6 (අඩි 3 1/2 X 2) | 11500 (4600) |
| | මීටර් 1.2 X 0.6 (අඩි 4 X 2) | 9700 (3880) |

3. සහනාධාර මුදල් ගෙවීම,

අළුත් වගා සහනාධාර ක්‍රමය යටතේ පාංශු සාරවත්භාවය පවතින ඉඩම් සඳහා සහනාධාර ලබා දෙන දෘශ්‍ය නිර්නායක පාදක කර ගනිමින් ප්‍රමාණවත් පාංශු සාරවත්භාවයක් නොමැති ඉඩම් සඳහා පස සාරවත් කිරීම සහිතව හා පාංශු සාරවත්භාවය පවතින ඉඩම් සඳහා පස සාරවත් කිරීමේ වාරික රහිතව පහත පරිදි සහනාධාර ගෙවීමට කටයුතු කල යුතුය..

| වාරිකය | පස සාරවත් කිරීම සහිතව හෙක්ටයාරයකට ආධාර මුදල (රු.) | පස සාරවත් කිරීම රහිතව හෙක්ටයාරයකට ආධාර මුදල (රු.) |
|---|---|---|
| 1. බිම් සැකසීම | 82,500.00 | 82,500.00 |
| 2. පස පුනරුත්තාපනය i | 30,000.00 | - |
| 3. පස පුනරුත්තාපනය ii | 120,000.00 | - |
| 4. පැල සිටුවීම | 37,500.00 | 120,000.00 |
| 5. වගා නඩත්තුව | 30,000.00 | 30,000.00 |
| **එකතුව** | 300,000.00 | 232,500.00 |

4. පොල් වගාව පවතින ඉඩම්වල එක් ඉඩම් හිමියෙකු සඳහා වසරකට හෙක්ටයාරයක උපරිම බිම ප්‍රමාණයකට යටත්ව පොල් සමග තේ මිශ්‍ර වගාව සඳහා සහනාධාර ලබාදිය හැක.

5. මේ යටතේ පස පුනරුත්තාපනයෙන් තොරව අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා RP/NP-4 මූලික පරීක්ෂණ වාර්තාවට අමතරව මේ සමග ඇති (ඇමුණුම-01) මාර්ගෝපදේශයට අනුව RP/NP-4 A ආකෘතිය මගින් පස පුනරුත්තාපනයෙන් තොරව තේ අලුත් වගාව සඳහා යෝග්‍යතාවය පිළිබඳ නිර්දේශය ලබාදිය යුතුය.

6. පොල් වගාව පවතින ඉඩම්වල තේ අලුත් වගාව සඳහා අවසරපත්‍ර ලබාදීමේදී සහනාධාර පරිගණක වැඩසටහනේ CT/NP කේතය පස පුනරුත්තාපනය සහිත අවසරපත්‍ර සඳහාත්, CT/NPA කේතය පස පුනරුත්තාපනය රහිත අවසරපත්‍ර සඳහාත් භාවිතයට ගතයුතුය.

7. පවතින පොල්වගාව තුල තේ අලුත් වගාවට ඉල්ලුම් කරන ඉඩම්වල මූලික පරීක්ෂන වාර්තාවේ අංක: (8) යටතේ නිර්දේශ ලබාදීමේදී ආධාර ක්‍රමය " පොල් සමග තේ අලුත් වගාව " ලෙසට තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි විසින් සටහන් කල යුතුය.

**මහින්ද විදානපතිරණ**

සභාපති.

<u>පිටපත්:-</u>

01.සාමාන්‍යාධිකාරි
02.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(සංවර්ධන/ව්‍යාප්ති)
03.අභ්‍යන්තර විගණක
04.කළමනාකරු (සංවර්ධන/මානව සම්පත්/මුදල්/සැලසුම් හා නියමුකරණ)
05.සියලුම මාණ්ඩලික නිලධාරීන්
06.සියලුම කලාප තේ සංවර්ධන නිලධාරීන්
07.සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
08.ගරු ලේකම්/ගරු සභාපති සමස්ත ලංකා සමිති සංවිධානය

ඇමුණුම - 01

## පස පුනරුත්ථාපනයෙන් තොරව හෝ නැවත වගාවට/අළුත් වගාවට යෝග්‍යතාවය නිර්ණය කිරීම සදහා මාර්ගෝපදේශය.

i. මෙම අනුග්‍රහය යටතේ අවසරපත්‍ර ලබාගැනීමට අපේක්ෂා කරන ඉඩම්වල මූලික පරීක්ෂණ අවස්ථාවේදී හෝ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් මූලික පරීක්ෂණ වාර්තාව සමග RP/NP-4A ආකෘතියෙන් පස සාරවත් කිරීමෙන් තොරව අවසරපත්‍ර ලබාදීම සදහා නිර්දේශය ලබාදිය යුතුය.

ii. RP/NP-4A ආකෘතියේ දක්වා ඇති දෘෂ්‍ය නිර්නායක 6 ක් පාදක කොටගෙන එක් එක් නිර්නායකයට අදාලව ඉඩමේ පවත්නා තත්වය සළකා බලා ලකුණු ලබාදීම සිදුකල යුතුය.

iii. නිර්නායක 6 ම ඒකාබද්ධව සළකා බලන විට ලැබිය හැකි උපරිම සමස්ථ ලකුණු ප්‍රමාණය 17 කි. සලකා බලන ඉඩමේ සමස්ථ ලකුණු එකතුව ලකුණු 10 ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා විටදී පමණක් පස සාරවත් කිරීමෙන් තොරව හේ අළුත්වගාව/නැවත වගාව සදහා නිර්දේශ ලබාදිය හැකිය.

iv. මෙම අනුග්‍රහය යටතේ සළකා බැලීමට සුදුසුකම් ලබන යම් කුඩා තේ වතු හිමියෙකු පස සාරවත් කිරීම සහිතවම තේ අළුත් වගාව/නැවත වගාව කිරීමට සුදානම් නම් මෙම RP/NP-4A ආකෘතිය මූලික පරීක්ෂණ අවස්ථාව සදහා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර මූලික පරීක්ෂණ වාර්තාවේ වගාකරු පස සාරවත් කිරීම සහිතව අළුත් වගාව/නැවත වගාව කිරීමට කැමති බව සදහන් කිරීමට කටයුතු කළයුතුය.

## පස පුනරුත්ථාපනයෙන් තොරව තේ අළුත්වගාවට/තේ නැවත වගාවට යෝග්‍යතාවය පිළිබඳ වාර්තාව

( පුනරුත්ථාපනයෙන් තොරව තේ වගා කිරීමට අපේක්ෂා කරන ඉල්ලුම්කරුවන්ගේ ඉඩම් සඳහා යොදාගත යුතු වේ.)

ල්ලුම්කරුගේ නම :................................................................................. අංකය

ඉඩමේ නම :..................................................................................................

---

තේ අළුත් වගාවට/නැවත වගාවට* යෝජිත ඉඩමේ දැනට ඇති වෘක්ෂලතාවල වර්ධනය :

| දුර්වලයි | මධ්‍යස්ථයි | හොඳයි |
|---|---|---|
| 0 | 1 | 2 |

---

යෝජිත ඉඩමේ දැනට පවතින වෘක්ෂලතා මගින් බිම් ආවරණය:

| 0 -25% | 26-50% | 51-75% | 76-100% |
|---|---|---|---|
| 0 | 1 | 2 | 3 |

---

පසේ ස්වභාවය :

| වැලි අධික | බොරළු අධික | මැටි අධික | ලෝම |
|---|---|---|---|
| 1 | 2 | 2 | 3 |

---

පසේ ගැඹුර :

| <2’ | 2’-3’ | 3’< |
|---|---|---|
| 1 | 2 | 3 |

---

මතුපිට පස සෝදා පාළුවීමේ තත්ත්වය:

| අධිකයි | මධ්‍යස්ථයි | සුළුයි |
|---|---|---|
| 0 | 1 | 2 |

---

මතුපිට පසේ සරු බව:

| දුර්වලයි | මධ්‍යස්ථයි | හොඳයි | ඉතා හොඳයි |
|---|---|---|---|
| 1 | 2 | 3 | 4 |

---

සමස්ථ ලකුණු එකතුව :

---

ත ලකුණු පාදකව මෙම ඉඩමේ පස පුනරුත්ථාපනය සහිතව /රහිතව* හෙක්:.................................
ත්:..........රූ....... පර්....... )ක තේ අළුත් වගා/නැවත වගා* කිරීමට නිර්දේශ කරමි.

"

ය:.....................................................  .................................................................

තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී

- නිර්නායකයන්ට අදාල ලකුණ කවයකින් සලකුණු කරන්න.
- මුළු ලකුණු එකතුව ලකුණු 10 ක් හෝ ඊට වැඩිනම් පස පුනරුත්ථාපනය රහිතව තේ අළුත් වගාව/නැවත වගාව සඳහා නිර්දේශ කළහැක.

* අදාල නොවන වචනය කපාහරින්න.